# කැලණිය අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2018

**ශ්‍රේණිය - 11　　විෂයය- නැටුම්(දේශීය)　　පත්‍රය- 1　　පැය- 01**

සැලකිය යුතුයි.　සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- ❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (x) ලකුණ යොදන්න.

- අංක 1 සිට 10 තෙක් ප්‍රශ්න වල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

1. නැටුමට උචිත ශරීර නම්‍යතාවයක් ඇති කර ගැනීම සඳහා .............................අභ්‍යාසයේ යෙදේ.

   I ) වන්නම්　　II). සරඹ　　III) . ලය　　IV ). පද

2. වන්නමක අන්තර්ගත විස්තරය කියැවෙන්නේ ..........................................

   I) .තානමෙන්ය　　II ). බෙර මාත්‍රයෙන්ය　　III) . කවියෙන්ය　　IV) . මාත්‍රාවලින්ය

3. දෙතිත හා තනිතිත වශයෙන් තාල රූප 2ට අනුව නටනු ලබනුයේ ................................ වන්නම යි.

   I ) වෛරොඩි　　II )මුසලඩි　　III) තුරගා　　IV ) සැවුලා

4. සටනක වීරත්වය ඉස්මතු වන පරිදි රචනා කර ඇති ගී විශේෂය ලෙස ...............................කවි දැක්විය හැකිය.

   I) හටන්　　II) ප්‍රශස්ති　　III)ග්‍රහපන්ති　　IV) මෝල් ගස්

5. ග්‍රහ පන්ති කවි ගායනයේදී සිහිපත් කෙරෙනුයේ .........................................ය.

   I) පත්තිනි දෙවියන්ය　　II) කොහොඹා දෙවියන්ය

   III) ඉරු දෙවියන්ය　　IV) නවග්‍රහයින් ය

6. දෙතිතක් සෑදීමට අවශ්‍ය වන තිත් රූප ගණනින් .............................................

   I) 3 කි　　II). 4කි　　III). 2කි　　IV). 5කි

7. උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නම් අතරින් උපදේශනාත්මක බව දක්වනුයේ ............................වන්නමෙනි.

   I ). මුසලඩි　　II.)හනුමා　　III).සිංහරාජ　　IV).තුරගා

8. “................................දිග මොහොල කපන්නේ”....... යන කවි පදයට අනුව මොහොලෙහි දිග වනුයේ

   I). තුන් වියතක්　　II).සිව් වියතක්　　III).සත් වියතක්　　IV).පස් වියතක්

9. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ...............................සබ නැටුම් විශේෂයක් ලෙස දැක්විය හැකිය.

   I). පන්තේරු නැටුම　　II).කඩු නැටුම　　III).අස්නෙ නැටුම　　IV).ආවැන්දුම නැටුම

10. මහා සමන් දේවාලයේ දී ...................................ප්‍රථමයෙන් ඉදිරිපත් කර ඇත.

    I). උඩරට වන්නම්　　II).සින්දු වන්නම්

    III).සබරගමු වන්නම්　　IV).පහතරට වන්නම්

11. උසස් අධ්‍යාපනය සඳහා සෞන්දර්යය අධ්‍යයන ආයතනය ආරම්භ වූ වර්ෂය වන්නේ

I ) 1974 II). 1972 III) 1978 IV). 1952

12. නර්තන කලාවේ නව ප්‍රවණතාවන් ඇති වීමට පසුබිම් වූයේ

i. ඉබන් බතූතා විදේශිකයාගේ පැමිණීමය.
ii. රවීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ පැමිණීමය.
iii. ස්පිල් බර්ජන් විදේශිකයාගේ පැමිණීමය.
iv. රොබට් නොක්ස් විදේශිකයාගේ පැමිණීමය.

13. ''පෙර සිට පැවත එන සිරිතට පොදිය බැඳගෙන'' යන කවිය ගයමින් සභයට පැමිණෙන්නේ

I ) ලෙංචිනාය II).මුදලි III) . ජසයා IV).ආරච්චිල

14. මුසලඩි වන්නමට ප්‍රස්තුත වී ඇත්තේ

I ) හාවාගේ ගති ස්වභාවයයි. II).වඳුරාගේ ගති ස්වභාවයයි.

III) . අශ්වයාගේ ගති ස්වභාවයයි. IV).නයාගේ ගති ස්වභාවයයි.

15. තුන් තිතේ තාල ප්‍රභේද ප්‍රස්තාරකරණයේ දී භාවිත කරන සංකේත වනුයේ

I ) ^ / ^ II)./^ ^ III) . ^ ^/ IV). V/^

16. රජු පිළිබඳ ගුණ වර්ණනා කිරිම සඳහා යොදා ගත් ගායකයින් හඳුන්වනුයේ

I ) දාසීන් ලෙසය II).වන්දිභට්ටයන් ලෙසය

III) . ගී කියන්නන් ලෙසය IV).අතෝරකරුවන් ලෙසය

17. ''නෘත්‍ය රත්නාකරය''කෘතිය රචනා කර ඇත්තේ

I ) ජේ.ඊ සේදරමන් මහතා II).මුදියන්සේ දිසානායක මහතා

III) . සී.ද.එස් කුලතිලක මහතා IV).බරණ ගණිතයා

18. ප්‍රාසාංගික නර්තනයක් ඉදිරිපත් කිරීමේ දී බාහිර ස්වරූපය වෙනස් නොවන පරිදි අංග රචනය කිරීම

I ) චරිතාංග අංග රචනයයි II).ශෛලිගත අංග රචනයයි

III) . ස්වාභාවික අංග රචනයයි IV).විකාර රූපී අංග රචනයයි

19. උඩරට වන්නම් වලට අමතරව නිර්මාණය වූ වන්නමකි

I ) උකුසා වන්නම II).මහබෝ වන්නම III) . අසදෘස වන්නම IV).ගාහක වන්නම

20. තාල තැබීමේදී සමගුණයෙහි දෙගුණය ලෙස හඳුන්වන්නේ

I ) ත්‍රිවිධ ලය II).විලම්භ ලය III) . දෘත ලය IV). මධ්‍ය ලය

21. ආගමික සිද්ධස්ථානයකට ප්‍රවේශ වූ ඔබ තුළින් ප්‍රදර්ශනය වන්නේ

I ) හාස භාවයයි II).රෞද්‍ර භාවයයි III) . ශාන්ත භාවයයි IV).කරුණා භාවයයි

- පහත රූප සටහන උපයෝගී කර ගනිමින් ප්‍රශ්න අංක 22, 23 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

22. රූපයෙන් දැක්වෙන නාටකය වනුයේ

I.රයිගම් කෝරළයේ ප්‍රචලිත කෝලම් නාටකයයි

II.සත් කෝරළයේ ප්‍රචලිත කෝලම් නාටකයයි

III.සතර කෝරළයේ ප්‍රචලිත කෝලම් නාටකයයි

Iv.කුකුළු කෝරළයේ ප්‍රචලිත කෝලම් නාටකයයි

23.රූපයෙන් දැක්වෙන නාටකයේ ගායනය සිදු කරනු ලබන්නේ

I.පොතේ ගුරු හෙවත් අණබෙරකරුය

II.කාරියකරවන රාල හෙවත් ජසයාය

III.කාරියකරවන රාල හෙවත් පොතේ ගුරුය

Iv.කාරියකරවන රාල හෙවත් බෙර වාදකයාය

- ප්‍රශ්න අංක 24 ,25 හා 26 සඳහා නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න.

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| A | නාග රාක්ෂ | හනුමා | සඳ කිඳුරු | කොවුලා |
| B | හොරණෑව | ගැට බෙරය | යක්බෙරය | අත්මිණිය |
| C | අතපත්තු මුදලි | ගණිතාලංකාර | බරණ ගණිතයා | බලි ඇදුරා |

24.වන්නම් රචනා කිරීම සඳහා ප්‍රස්තුත වූ සත්ත්වයින් දැක්වෙන්නේ

I. A පේළියේ 2 හා 4 තීරුවේය II.A පේළියේ 1 හා 4 තීරුවේය

III) . A පේළියේ 1 හා 2 තීරුවේය IV)..A පේළියේ 3 හා 4 තීරුවේය

25.සින්දු වන්නම් රචනා කරන ලද පුද්ගල නාමය දැක්වෙන්නේ

I. C පේළියේ 1 තීරුවේය II.Cපේළියේ 2 තීරුවේය

III. C පේළියේ 3 තීරුවේය IV).Cපේළියේ 4 තීරුවේය

26. උඩරට සම්ප්‍රදායේ ගුහ පන්ති ගායනයේ දී තාල තැබීම හා වාදනය සඳහා උපයෝගී කර ගන්නා වාද්‍ය භාණ්ඩයන් දැක්වෙන්නේ ,

I.B පේළියේ 1 හා 3 තීරුවේය II. B පේළියේ 2 හා 4 තීරුවේය

III.B පේළියේ 1 හා 2 තීරුවේය Iv.B පේළියේ 3 හා 4 තීරුවේය

27.දිසා, තල,රටා,මෝස්තර මේවා

I. අවකාශ භාවිතය හා බැඳි සංකල්ප වේ II. නර්තනය හා බැඳි සංකල්ප වේ

III. තාලයේ මූල ධර්ම වේ Iv.නම තා අභ්‍යාස වේ.

28.තාලයක් අනුව ගීතයක් ප්‍රස්තාර කිරිමේ දී අවධානය යොමු කළ යුතු මාත්‍රා වර්ග දෙක වනුයේ

I.ගුරු හා පද II).ලඝු හා පද III) . ලඝු හා ගුරු IV).ලඝු හා මාත්‍රා

29.මාත්‍රා 3+4 යන තාල රූපය හඳුන්වන්නේ

I.සුළු මහා දෙතිත ලෙසය II).මැදුම් මහා දෙතිත ලෙසය

III) . මහා මැදුම් දෙතිත ලෙසය IV). මැදුම් මහා දෙතිත ලෙසය

30.බෙර වාදනය පුහුණු වීමේ දී ප්‍රගුණ කළ යුතු නියමිත සරඹ ගණනින්

I. 12කි II).8කි III) . 6කි IV).18කි

31.උඩරට නර්තන සම්ප්‍රදායේ මූලික අංග හාරය වනුයේ

i. තුන් වියත් තුනඟුලක් වූ මණ්ඩියයි II.මිටි රියනක දුර ප්‍රමාණය වූ මණ්ඩියයි

III) මිටි රියනක දුර ප්‍රමාණය වූ අරමණ්ඩියයි Iv.රියනක දුර ප්‍රමාණය වූ මණ්ඩියයි

32.‘‘**තක්කඩ කඩ තක ජිජි කුද**’’ මෙම පද කොටස නටනු ලබන්නේ ගොඩ සරඹ වල

i. අංගහාර සරඹයේ කස්තිරමටය II.අර්ධ චක්‍ර සරඹයේ කස්තිරමටය

III) .දෑත පැගිමේ කස්තිරමටය Iv.පැනීම් සරඹයේ කස්තිරමටය

33. **‘‘දෝං ජිං ජිං තකට දොංතක’’** මෙම බෙර පදය

I) දවුල් වාදනයට අදාල පද කොටසකි. II.යක්බෙර වාදනයට අදාල පද කොටසකි.

III) ගැටබෙර වාදනයට අදාල පද කොටසකි. Iv. තම්මැට්ටම් වාදනයට අදාල පද කොටසකි.

34. ‘‘තත්තොග තක....තත්කඩ....තක තොග....’’ මෙම අඩව්ව සම්පූර්ණ කිරීමට අදාළ පද යුගලය වන්නේ

I) තොග , තරිකිට II. තරිකිට,තොග

III) කුද,තරිකිට Iv.කුද,ජික්කඩ

35.‘‘මේ ඇත්තමයි සත්ත කියනෙමි’’....මෙම කවි පදය ඇතුලත් වන්නේ

I.සැවුලා වන්නමටය II.මුසලඩි වන්නමටය

III) සිංහරාජ වන්නමටය Iv.තුරඟා වන්නමටය

36. ‘‘දොං තකු දොංතකු දොං ජිං ගත් තත් ජිං තරිකිට’’ බෙර පදය අයත් තාල රූපය වන්නේ

I. මාත්‍රා 2+2+4 තාල රූපයටය II. මාත්‍රා 2+2+3 තාල රූපයටය

III.මාත්‍රා 2+3+3 තාල රූපයටය Iv. මාත්‍රා 2+3+4 තාල රූපයටය

37.කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පමණක් දක්නට ලැබෙන නර්තන අංග දෙකකි

I) යක් ඇනවුම,දෙවොල් නැටීම II.දෙවොල් නැටීම, මඩු පුරය

III). අස්නෙ,දෙවොල් නැටීම Iv.යක් ඇනවුම,අස්නෙ

38.හටන් ගී ගයමින් යෙදෙන නර්තනයේ දී යොදා ගන්නා රංග භාණ්ඩ වන්නේ

I) කඩුව හා පළිහ II.කඩුව හා දුන්න III. පළිහ හා දුන්න Iv.දුන්න හා ඊතල

39.ප්‍රධාන ශාන්ති කර්මයන් හි යොදා ගන්නා රඟ මඩලෙහි පළල වන්නේ

I) සැට රියනයි II. තිස් රියනයි III.පස් රියනයි Iv.විසි රියනයි

40.උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩයේ කොටස් කිහිපයකි.

I) බෙර කඳ,කන්වරය ,ඉල්ලම් II.බෙර කඳ, ඉල්ලම්,සුරත් තට්ටුව

III) බෙර කඳ ,කයිපුඩි වළල්ල,වෙනිවර කැරැල්ල Iv. බෙර ලණුව,සුරත් තට්ටුව, ඉල්ලම්